# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2070/17 - 2018 මැයි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට නායයෑමෙන් අවතැන්වූවන් වෙත පානීය ජල පහසුකම් ලබාදීමට ජල පිරිපහදු ඒකකය හා ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 01 වැනි දින,<br>අංක 35, "ලක්දිය මැදුර",<br>නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>5/2/2/1371.

### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 33A අට්ටාපිටිය ග්‍රාම නිලධාරී වසමේ අට්ටාපිටිය ගමේ පිහිටි කෝන්ගහකැලේ වත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : එම්. ඒ. අතුල ආනන්ද බණ්ඩාර මහතා,<br>බුළුගම්මන,<br>අරණායක.

05 - 623

1A - G 27576 — 18 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*